# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2101/15 - 2018 දෙසැම්බර් මස 10 වැනි සඳුදා - 2018.12.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ගොනු අංකය* : කඩු/ඉඩම්/03/160/CEB.
*ඉඩම් අමාත්‍යාංශ අංකය* : 4-3/2/2018/CEB/163.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 480 වැලිපිල්ලෑව ග්‍රාම නිලධාරී වසමේ දූඩිගමුව ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙළ කරන ලද පිඹුරු අංක "මූ.පි.කො. 9798" හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0510 ක් පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කොටස:

**මූලික පිඹුරු අංක මූ.පි.කො. 9798 හි කැබලි අංක 01**

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: පුවක්ගහදෙනිය කුඹුර; වර්තමාන ඉඩම් පරිහරණය: හිස් ඉඩම; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: වරුණ යසස් අඹුල්දෙනිය, අංක 58/16, ශාලාව පාර, ඇඹුල්දෙනිය, නුගේගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0510.

ඉහත සඳහන් ඉඩම/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.01.09 දින පෙ.ව. 10.00ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2019.01.02 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබා ගැනීම වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම් දිය යුතුය.

ඒ. ඩී. වයි. ආනන්දනී,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2018 දෙසැම්බර් මස 10 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-721